# ජන ක්‍රීඩා ඇසුරින් සාමූහික රංගනයේ යෙදෙමු

අතීත ජනයා තුළ ප්‍රචලිත කතා, ජන කතා වනවා සේම අතීත ගැමියා තුළ විනෝදාස්වාදය සඳහා කරන ලද ක්‍රීඩා ජන ක්‍රීඩා වේ. මේවා තුළ නොඅඩුව සෞන්දර්ය ද ගැබ්ව ඇත. අපේ දේශීය ජන ක්‍රීඩා රැසක් ඇත. අද සමහර අවුරුදු උත්සව වලදී ද ජන ක්‍රීඩා පවත්වයි. නමුත් අප සමාජයේ ජන ක්‍රීඩා ක්‍රම ක්‍රමයෙන් ගිලිහී යයි. ඊට හේතුවන්නේ එම ක්‍රීඩා පවත්වන ක්‍රම සහ විධි වත්මන් පරපුර නොදන්නාකමයි. අප සතු ජන ක්‍රීඩා බොහෝමයකි.



- එළුවන් කෑම
- මේවර කෙළිය
- පනා හැංගීම
- ලේන්සු හැංගීම
- පොරපොල් ගැසීම
- චකගුඩු පැනීම

වැනි ජන ක්‍රීඩා අතීත ලාංකීය සමාජය තුළ විනෝදාස්වාද මාධ්‍යකි.

මෙකී ජන ක්‍රීඩා තුළින් දැකිය හැකි විශේෂ ලක්ෂණය වන්නේ සාමූහික බවයි. ඒවා පිරිසක් එක්ව සිදුකරයි. එනිසාම ජන ක්‍රීඩාව තුළ අපූරු සුනදරත්වයක් ගැබ්ව ඇත. ඊට අමතරව ජන නැටුම්, ජන රංගන විලාශයන් මගින් මෙම ක්‍රීඩා නිර්මාණය කරඇත. දේශීය සංස්කෘතියට මුලතැනක් දීම එමගින් මනාව පසක් වේ.

චලනය , ගායනය, රිද්මය, තාලය ආදී සෞන්දර්යාත්මක ලක්ෂණ මෙම ක්‍රීඩා තුළ අන්තර්ගත වී ඇත. එනිසා නාට්‍යමය ස්වරූපයෙන් ජනක්‍රීඩා භාවිත කළ හැක.

## එළුවන් කෑම

එළුවන් කන්නයි මන් ආවේ

එළුබෙටි කාපන් තුන්දීරේ.................

ආදී ගායනා කරමින් ක්‍රීඩා කරයි. කෙනෙකු කොටියෙකු ලෙසත්

කෙනෙකු එළුවෙකු ලෙසත් හැසිරෙයි. ඉතිරි පිරිස අත්බැද රවුමක් සෑදී එළුවා ආරක්ෂා කරයි. සාම්ප්‍රදායික ගායන විලාස වලින් සමන්විත සරල රංගන ක්‍රියාකාරකම් හා බැදුණු ක්‍රීඩාවකි.

**<u>මේවර කෙළිය</u>**

ගීත ගායනාවන් සමග බැඳි ජන ක්‍රීඩාවකි. සරල රංගන ක්‍රියාකාරකම් සහිත ක්‍රීඩාවකි. ප්‍රශ්න හා පිළිතුරු ලෙස රංගනයක් ඉදිරිපත් කරයි. මෙහිදී ද එකමුතුකම, සුහදතාව, සහජීවනය වර්ධනය වේ.

සාරසදිසි පෙති පේර නෙළන කල වලගිය දෝ මගේ මේවරයා

නැනෝ නුඹපල් නුඹෙ දරුවන් පල් අප දුටුවේ නැත මේවරයා............



ජනක්‍රීඩා ආශ්‍රිතව විවිධ ගීත ලියවී ඇත.

**චක් ගුඩු ගුඩු - විශාරද එඩ්වඩ් ජයනකාඩි මහතා**

**තැන තැන රවුමට ඉදගෙන - විශාරද එඩ්වඩ් ජයනකාඩි මහතා**

ඉහත දැක්වූ පරිදි ඕනෑම ජනක්‍රීඩාවකින් රංගනයක් ඉදිරිපත් කළ හැක. එසේ කිරීම මගින්

- නිරෝගී බව
- සහයෝගය
- සාමූහිකත්වය
- සතුට
- එකමුතුකම
- ජය පැරදුම සමව විඳගැනීම
- විවේකය ඵලදායීව ගත කිරීම

ආදිය හිමිවේ.

**ඊට අමතරව ජනක්‍රීඩා වල ඇති චලන, ගායන, රිද්මය ආදිය තුළ නාට්‍යමය ස්වරූපයන් ඇති හෙයින් ක්‍රීඩා වල යෙදීමෙන් රංගන හැකියාව නිරතුරුවම වර්ධනය කරගත හැකිය.**

පැවරුම : 1) ජනක්‍රීඩා වල සිටින චරිත වලට ගැළපෙන රංග වස්ත්‍ර අඳින්න.

2) ජනක්‍රීඩා ඇසුරෙන් රංගනයන් නිර්මාණය කරන්න.